# 7 මධ්‍යකාලීන යුරෝපයේ දේශපාලන ආර්ථික සහ සංස්කෘතික අභිවර්ධනය

**රැකියාව මගින් බැඳ දැමූ වැඩවසම් ක්‍රමය, එකල බලවත් පිරිසක් ලෙස නැගී ආ ඉස්ලාම් භක්තිකයන් වූ තුර්කීන් විසින් යුරෝපියයන්ගෙන් ප්‍රධාන ආර්ථික මධ්‍යස්ථානය වූ කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම සමග බිඳ වැටුණි. එහි ප්‍රතිඵල ලෙස යුරෝපයට ආලෝකයක් වූ පුනරුදයත්, ජාතික රාජ්‍ය බිහිවීමත්, දේශ ගවේෂණය හා ආගමික ප්‍රතිසංස්කරණත් සිදු විය. එය යුරෝපයට පමණක් නොව ලෝකයට ම බලපෑ සිද්ධි මාලාවකි. ලෝකය වෙනස් මගකට යොමු කළ එම සිද්ධි මාලාව මෙම ඒකකය ඇසුරින් ඔබට අධ්‍යයනය කිරීමට ඉඩ සලසා ඇත.**

යුරෝපයේ මධ්‍යතන යුගය ලෙස ක්‍රි.ව. 500 සිට ක්‍රි.ව. 1500 අතර කාලය සැලකේ.

**වැඩවසම් ක්‍රමය**

**වැඩවසම් ක්‍රමය යනු රජුගේ සිට පහළ ම මට්ටමේ ඉඩම් හිමියා දක්වා සියලු දෙනා ම ඉඩම් භුක්තිය වෙනුවෙන් ඉටුකරන වගකීම් සමුදයක් එකට බැඳී පවතින සම්පූර්ණ සමාජ සංවිධානයකි.**

**- ස්ටබ්ස් -**

වැඩවසම් ක්‍රමය විවිධ රටවල විවිධ ස්වරූපයෙන් ක්‍රියාත්මක වී ඇත. එහෙයින් එයට නිශ්චිත අර්ථකථනයක් දීම අපහසු ය. සෑම රටක ම පාහේ ක්‍රියාත්මක වූ වැඩවසම් ක්‍රමයේ පොදු ලක්ෂණ ඇත. ඒ අනුව වැඩවසම් ක්‍රමය යනු ඉඩම් භුක්තිය හා ඒ වෙනුවෙන් සේවා සැපයීම පදනම් කරගත් දේශපාලන, සමාජ, ආර්ථික මෙන් ම සංස්කෘතික සංවිධාන ක්‍රමයක් ලෙස අර්ථ දැක්විය හැකි ය.



**රූපය 7.1 -**
**වැඩවසම් ක්‍රමය, වංශාධිපතිවරුන්ගේ ඉඩම්වල වැඩකරන දසයෝ**

**වැඩවසම් ක්‍රමයේ පොදු ලක්ෂණ**

- ඉඩම් හිමියා සහ ප්‍රවේණිදාසයා අතර ඇති සබඳතාව
- පුද්ගල බද්ධ පාලන ක්‍රමය
- ඉඩම් භුක්ති විඳීම වෙනුවට සේවය සැපයීම
- ප්‍රාදේශීය පාලකයන් සතු පෞද්ගලික හමුදාව
- ප්‍රවේණි දසයා වෙනුවෙන් ඉටුකළ යුතු යුතුකම් රැසක් ඉඩම් හිමියා සතු වීම.

## වැඩවසම් ක්‍රමයේ ආරම්භය

ක්‍රි.ව. නවවන සියවස පමණ වන විට බටහිර රෝම අධිරාජ්‍යයේ ඉතා සශ්‍රීක ව තිබූ කැරොලින්ජියන් අධිරාජ්‍යය පරිහානියට පත් වෙද්දී එයට විදේශ ආක්‍රමණ එල්ල විය. එනම්, උතුරු දෙසින් වෛකිංවරුන් ද නැගෙනහිරින් හන්වරුන් හා දකුණු දෙසින් මුස්ලිම්වරුන් ද වශයෙනි. මේ කාලය වන විට රජවරු මෙම ආක්‍රමණවලට මුහුණ දීමට තරම් බලවත් ව නොසිටි බැවින්, ඒ වන විට සමාජයේ ඉහළ තලයේ සිටි වංශාධිපතිවරුන්ගෙන් ආධාර අපේක්ෂා කළෝ ය. මුස්ලිම් ව්‍යාප්තිය හා වෛකිං ආක්‍රමණ නිසා යුරෝපය බාහිර රටවල් සමග ගෙනගිය වෙළඳ කටයුතු සම්පූර්ණයෙන් ම ඇණහිටීම නිසා රජුගේ ආදායම් මාර්ග ද පහත වැටුණි. රජු වංශාධිපතිවරුන්ගේ ආධාර ලබා ගැනීමේ දී ඔහුගේ එක ම ආදායම් මාර්ගය වූ ඉඩම් විශාල වශයෙන් වංශාධිපතිවරුන් වෙත පවරන ලදී. ඒ සමග ම ඒ ප්‍රදේශවල ජීවත් වූවන් සම්බන්ධ අධිකරණ බලතල ද ඔවුන් වෙත පැවරිණි. ඊට අමතර ව රට වැසියන් වෙනුවෙන් ආරක්ෂාව සැපයීම ද වංශාධිපතිවරුන්ට භාර විය.

සාමාන්‍ය ජනතාව ද ඔවුන් සතු ව තිබූ නිදහස් ඉඩම් විදේශ ආක්‍රමණ හමුවේ රජයේ ආරක්ෂාව නොලැබීම හේතුවෙන් ධනවත් වංශාධිපතියෙකුට භාර දී ඒ වෙනුවෙන් තමන්ට ආරක්ෂාව පැතූහ. එසේ වංශාධිපතියාට හිමි වු ඉඩම් භුක්ති විඳීම හේතුවෙන් ඔහුට සේවය කරන ගැත්තන් බවට මේ පුද්ගලයෝ පත් වූහ. මේ ජනතාවට ආරක්ෂාව සැපයීම ඉඩම් හිමිකරගත් වංශාධිපතිගේ වගකීම විය. රජු හා වංශාධිපති, වැසියන් හා වංශාධිපති අතර ඇති වූ මේ ගනුදෙනු ලිඛිත නීති අනුව සිදුවූවක් නො වේ. වැසියෝ ද ඈත සිටිනා රජුට වඩා ළඟ සිටින වංශාධිපතිවරුන් වෙත සමීප වූහ.

ඒ අනුව රජු හා වැසියන් අතර වූ සබඳතා බිඳ වැටී වංශාධිපතිවරුන් හා වැසියන් අතර සබඳතා ගොඩනැගිණි.

කෙසේ හෝ පස්වන සියවසේ සිට වරින්වර බටහිර යුරෝපයට ගෝත්‍රික ආක්‍රමණ එල්ල වෙද්දී එම අභියෝගයට මුහුණ දිය හැකි දේශපාලන හෝ ආර්ථික හෝ සංවිධානයක් නොවූ බැවින් ඊට අනුකූල ව යුරෝපීය සමාජය සකස් වීමෙන් වැඩවසම් ක්‍රමය බිහි විය.

# වැඩවසම් ක්‍රමයේ ලක්ෂණ.

## දේශපාලන

- සමාජයේ සැම පුද්ගලයකු ම කුමන හෝ අන්දමේ ප්‍රධානියෙකු යටතට පත්වීම
  නිදසුන් : රජු යටතේ වංශාධිපති, වංශාධිපති යටතේ නයිට්වරුන්, නයිට්වරුන් යටතේ සාමාන්‍ය ජනතාව
- ඒ අනුව බලය විකේන්ද්‍රගත වීම
- රජු වංශාධිපතිට පමණක් ප්‍රධානත්වය ඉසිලූ බලයෙන් අඩු පුද්ගලයෙකු වීම
- රජුගේ ජක ම ආදයම රජුට ම වෙන් වූ ඉඩම්වල බදුවලින් හා වංශාධිපතියන්ගේ ප්‍රදානයන් ඇසුරින් ලැබීම
- රාජ්‍ය හමුදවක් නොවීම
- වංශාධිපති ප්‍රාදේශීය පාලකයෝ ස්වාධීන ව කටයුතු කිරීම
- අධිකරණ කටයුතු වංශාධිපතිවරුන් සතු වීම
- ප්‍රාදේශීය පාලකයන් සතු ව පෞද්ගලික හමුදවක් සිටීම
- තමන්ට අයත් ප්‍රදේශ විශාල කරගැනීම සඳහා වංශාධිපතිවරුන් අතර බල තරගය

## ආර්ථික

- ප්‍රධාන ආදයම් මාර්ගය ඉඩම් වගා කිරීමෙන් ලැබෙන ආදයමයි
- ඉඩම හා බැඳුණු ආර්ථික රටාව
- රජුගෙන් විශාල වශයෙන් ඉඩම් ලද වංශාධිපතිවරුන් ඒවා කැබලි කර දෙවන තලයේ වංශාධිපතිවරුන් වෙත පවරන ලදී. එය ප්‍රවේණිය නමින් හැඳින්විණි
- ප්‍රවේණි වගා කිරීම ප්‍රවේණි දසයින් විසින් සිදු කිරීම
- ප්‍රවේණිවල ඉඩම් තීරු ලෙස වෙන්කර දසයන් අතර බෙදා දීම
- දසයන් තමන්ට අයත් කොටසේ තමාගේ ජීවනෝපාය සැකසීම හා ඒ වෙනුවෙන් වංශාධිපතිවරයාට වෙන් වූ කොටසේ නොමිලයේ සේවය කිරීම
- කට්ටිමාරු ක්‍රමය හා ශෂ්‍ය මාරු ක්‍රමය ඉඩම් වගාව සඳහා යොදා ගැනීම
- සුළු වශයෙන් කර්මාන්ත තිබීම
  නිදසුන් : ධාන්‍ය අඹරන මෝල, කම්හල, බේකරිය හා වයින් පෙරෙන යන්ත්‍ර
- ස්වයංපෝෂිත ආර්ථික රටාව
- වෙළෙඳාම ඉතා ස්වල්ප වශයෙන් භාණ්ඩ හුවමාරුව මගින් සිදු වීම
  නිදසුන් : කුළු බඩු සහ ලුණු සඳහා
- ප්‍රවේණිදසයාට ඉඩම් වෙන්කර දුන්නෙත් ඉඩම් වගා කළේත් සාමූහික ව අත්තම් ක්‍රමයටයි
- සතුන්, ගොවි උපකරණ භාවිතය, නඩත්තුව හවුලේ සිදු කිරීම
- ස්වයංපෝෂිත ආර්ථික රටාව නිසා නගර බිහි නොවීම
- නිෂ්පාදන අතිරික්තයක් නොවීම

| ශෂ්‍ය මාරු ක්‍රමය | කට්ටි මාරු ක්‍රමය |
|---|---|
| එක් එක් කන්නවලදී විවිධ භෝග වගා කිරීම | ඉඩම් කොටස් තුනකට බෙදා ඒවායේ එක් කට්ටියක ප්‍රධාන බෝගයකුත් අනෙක් කට්ටියේ පස සරු කරන බෝගයකුත් වගාකර ඉතිරි කට්ටිය පුරන්වීමට ඉඩ හැරීම |

## සමාජ

- ✍ උප්පත්තිය මත සමාජ තරාතිරම හිමිවීම
- ✍ සමාජයේ ඉහළ හා පහළ වශයෙන් පන්ති දෙකක් පැවතීම. නිදසුන් : වංශාධිපති - ඉහළ දසයන්- පහළ දසයන්
- ✍ ඉඩම් සාමාන්‍ය ජනතාවට හිමි නොවීම
- ✍ ඉඩම් භුක්තිය වෙනුවෙන් වංශාධිපතිවරුන්ට පඬුරු ලබාදීමට සිදු වීම
- ✍ ස්වකීය දරු පවුල හාමතේ සිටිය දී වුව ද ස්වාමියාට පුද පඬුරු ගෙවීමට දසයාට සිදු වීම
- ✍ ස්වාමිවරුන් සුඛෝපභෝගී ජීවිත ගත කිරීම හා සාමාන්‍ය ජනතාව අඩවහල් ජීවිත ගත කිරීම
- ✍ වංශාධිපතිවරුන් තම ප්‍රවේණි විශාල කර ගැනීම සඳහා තරඟ වැදුණු අතර සාමාන්‍ය ජනතාව සාමූහික ව ජීවත් වීම
- ✍ යුරෝපයේ එවකට පැවැති එක ම විධිමත් ආගමික සංවිධානය වූ කිතුනු සභාවට දේශපාලන හා සමාජීය වශයෙන් විශාල බලයක් තිබීම
- ✍ යුරෝපය දේශපාලනමය වශයෙන් වෙන් වූ රාජ්‍යයන් පැවතියත් ඒවා එක්සත් ව තබා ගැනීමට කිතුනු සභාව සමත් විය
- ✍ තාපසාරාම හා දේවස්ථාන කේන්ද්‍ර කොට ගෙන අධ්‍යාපනය වර්ධනය වීම
- ✍ සියලු කලා කටයුතු ආගමික මුහුණුවරක් ගැනීම

**නයිට්වරයා යනු ,**

රජුට හමුදව සැපයූ වංශාධිපතිවරයායි. ඒ අනුව නයිට්වරයාට විශාල ලෙස ඉඩම් රජ විසින් ප්‍රදානය කරන ලදී. නයිට්වරු අවශ්‍ය අවස්ථාවලදී රජුට සේවා සැපයීම කළ අතර අනෙකුත් අවස්ථාවල දී තමන්ට අවශ්‍ය පරිදි හමුදව පෞද්ගලික සේවයේ යෙදවූහ. මේ නිසා රජුට වඩා බලතල නයිට්වරයා සතු විය.



**රූපය 7.2 - වැඩවසම් සමයේ කලා කෘතියක්**

## වැඩවසම් ක්‍රමය බිඳවැටීම

කුරුස යුද්ධය, වෙළෙඳාමේ දියුණුව, වසංගත හා පුනරුදයෙන් ඇති වූ සමාජීය වෙනස ආදී හේතු මත ප්‍රවේණිදස ක්‍රමය ක්‍රමයෙන් බිඳ වැටුණි. කුරුස යුද්ධවලට සහභාගි වූ ප්‍රවේණි දසයන් ආපසු පැමිණීමේ දී ඔවුනට නිදහස ලැබුණි. බොහෝ විට වෙළෙඳ කටයුතු පිළිබඳ අවබෝධයක් ලබා පැමිණි මොවුහු තම ප්‍රවේණිවලට නොගොස් ඒ වන විට ගොඩනැගෙමින් තිබූ වෙළෙඳ නගරවල පදිංචි වූහ. යුද්ධයේ දී මියගිය ඇතැම් දසයන් ඉඩම් නිදහස් කිරීම හා ඇතැම් දසයන් කුලියට වැඩකර උපයාගත් මුදලින් ඉඩම් මිල දී ගැනීම ද සිදු විය. ඒ වාගේ ම වංශාධිපතිහු ද වේතන ගෙවා තම ඉඩම්වල වැඩකරවා ගැනීමට පුරුදු වූහ. මේ නිසා දෙළොස්වන සියවස පමණ වන විට වැඩවසම් ක්‍රමයේ පදනම වූ ප්‍රවේණි ක්‍රමය බිඳ වැටෙමින් පැවතුණි.

**ක්‍රියාකාරකම්**

**වැඩවසම් ක්‍රමය යනු කුමක් දැයි හඳුන්වා දෙමින් එහි මූලික ලක්ෂණ පහදමින් රචනාවක් ලියන්න.**

## කුරුස යුද්ධ හා වෙළඳාමේ දියුණුව.

ක්‍රි.ව. හත්වන සියවසේ දී ඉස්ලාම් භක්තිකයන් වූ තුර්කිවරුන් විසින් ක්‍රිස්තු භක්තිකයන්ගේ ශුද්ධ භූමිය වූ ජෙරුසෙලම අල්ලාගන්නා ලදී. මෙම ප්‍රදේශය ශුද්ධ භූමියක් ලෙස සැලකෙන්නේ ක්‍රිස්තුස් වහන්සේ මෙම භූමියේ උපත ලද බැවිනි. මුල් කාලවල දී ක්‍රිස්තු භක්තියන්ට ජෙරුසලම වැඳ පුද ගැනීමට තුර්කීන් විසින් ඉඩ දෙනු ලැබිණි. කෙසේ වෙතත් ඊට පසු කාලයේ දී තුර්කීහු ඔවුන් යටතේ පැවති ප්‍රදේශවල වන්දනා ගමන් ගිය ක්‍රිස්තු භක්තිකයන් කෙරෙහි විරුද්ධවාදී ආකල්පයක් දක්වන්නට වූහ. වන්දනාවේ ගිය ක්‍රිස්තු භක්තිකයන්ට හිංසා පීඩා කිරීම පමණක් නොව ඇතැම් විට මරා දැමීම පවා සිදුකර ඇත.




**රූපය 7.3 - කුරුස යුද්ධය**



**රූපය 7.4 - කොන්ස්තන්තිනෝපල් වරාය**

ඒ වාගේ ම කොන්ස්තන්තිනෝපල් නගරයට ද මෙම තුර්කි තර්ජන ඒ වන විට ඇති විය. ශුද්ධ භූමිය තුර්කීන් අතට පත්වීම නිසා කිතුනු භක්තිකයන්ට එහි වන්දනාමාන කිරීමට අවස්ථාවක් නැති විය. මේ නිසා ශුද්ධ වූ දේශය බේරා ගැනීම සඳහා පාප්වහන්සේ ප්‍රධාන කොටගත් කිතුනු යුරෝපය තුර්කීන් සමග සටනට එළඹිණි. එය කුරුස යුද්ධය ලෙස හැඳින්වූයේ සටනට ගිය අය කුරුස ලාංඡනය පැලඳ සිටි නිසා ය.




**සිතියම 7.1 - කොන්ස්තන්තිනෝපලයේ වැදගත්කම**

මෙම යුද්ධ පළමුවන කුරුස යුද්ධයෙන් ජෙරුසෙලම ක්‍රිස්තු භක්තිකයන් සතු වුවත් ඔවුනොවුන් අතර ඇති වූ ගැටලුකාරි තත්ත්වයන් මත නැවත ජෙරුසෙලම තුර්කීන් සතු විය.

මේ තත්ත්වය මත කුරුස යුද්ධ නමින් යුද්ධ මාලාවක් ක්‍රිස්තු භක්තිකයන් හා මුස්ලිම්වරුන් අතර ඇති විය. ක්‍රිස්තු භක්තිකයන් අතර ඇති වූ මතභේද, යුද්ධ සංවිධානයේ දුර්වල බව, යුද්ධයට සහභාගි වූ අය කොල්ලකෑම්වල යෙදීම ආදී කරුණු අනුව තුර්කීන් මේ යුද්ධවලින් ජයගත් අතර 1453 දී කොන්ස්තන්තිනෝපල් නගරය ද තුර්කීන් සතු විය.

**පෙර අපර දෙදිග වෙළඳ කටයුතුවල ප්‍රධාන මධ්‍යස්ථානය වූ නිසා කොන්ස්තන්තිනෝපලය වැදගත් වේ.**

කොන්ස්තන්තිනෝපල් නගරය තුර්කීන් සතු වීමෙන් යුරෝපා ජාතීන්ට පෙරදිගට එමට තිබූ වෙළඳ මාර්ග සම්පූර්ණයෙන් ම අවහිර විය.

වැඩවසම් යුගයේ ස්වයං පෝෂිත ආර්ථිකයට හුරු වී සිටි යුරෝපීයෝ කුරුස යුද්ධ කාලයේ පැමිණි මුස්ලිම් වෙළෙන්ඳන් මාර්ගයෙන් රන්, රිදී මුතු, මැණික්, කුළුබඩු, සුවඳ විලවුන්, රෙදිපිළි ආදී ආසියාතික ද්‍රව්‍ය භාවිතයට හුරු වූහ. යුරෝපීය වෙළෙන්දෝ කොන්ස්තන්තිනෝපලය වැනි මධ්‍යස්ථානවලට ගොස් මුස්ලිම් වෙළෙඳුන්ගෙන් ආසියාතික භාණ්ඩ මිල දී ගෙන යුරෝපය පුරා අලෙවි කළහ.

කුරුස යුද්ධ නිසා යුරෝපීයයෝ වෙළඳාමට නව ආලෝකයක් ලැබූ බව පෙනී යන කරුණකි. ප්‍රවේණි ක්‍රමය බිඳ වැටෙන විට එතෙක් පැවැති විකේන්ද්‍රගත පාලනය නැවත මධ්‍යගත වී නව රාජාණ්ඩු බිහිවීම දක්නට ලැබේ. රාජාණ්ඩු ක්‍රමය යටතේ යුරෝපා රටවල ජාතික වෙළඳ ප්‍රතිපත්ති සහ ජාතික බදු ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම ද තවලම්වලින් ගිය වෙළෙඳුන්ට සොරසතුරන්ගෙන් වන අලාභ හානි වැළැක්වීම ද මාර්ග ප්‍රතිසංස්කරණ කිරීම සඳහා නීතිරීති පැනවීම ද වෙළෙඳාමට රුකුලක් විය.

මේ කාලය වන විට යුරෝපීය නව රාජාණ්ඩුවල රජවරු ද වෙළෙඳාම ඇසුරෙන් විශාල ලාභ උපයාගත හැකි බව පෙනී ගිය බැවින් ඒ සඳහා අනුග්‍රහය දක්වූහ. රජවරු වැඩවසම් යුගයේ මෙන් වංශාධිපතීන් සමග නොව අලුතින් ගොඩනැගෙමින් ආ වෙළෙඳ පන්තිය සමග සබඳතා ගොඩනගා ගත්හ. එය වෙළෙඳාමේ දියුණුවට රුකුලක් විය.

වෙළෙඳාම පුළුල් කිරීම සඳහා රජයේ අනුග්‍රහය සෘජු ව ම ලබා දුනි. රජවරු ස්වකීය කීර්තිය සහ බලය වර්ධනය කර ගැනීම සඳහා මුදල් උපයා ගැනීමේ මාර්ගයක් වශයෙන් දේශ ගවේෂණ හා වෙළඳ කටයුතුවලට මැදිහත් වූහ.



රූපය 7.5 - කාසි



රූපය 7.6 -
ඉතාලියේ පළමුවෙනි බැංකුව



රූපය 7.7 - යුරෝපයේ මුදල්

වෙළෙඳාම පුළුල් වී ධනය එකතුවීම නිසා වෙළෙඳ කටයුතු පහසුවෙන් කරගෙන යාම සඳහා විනිමය මාධ්‍යයක අවශ්‍යතාව මතු විය. ඒ අනුව කාසි අච්චු ගැසීම සිදු විය. ඒ වාගේ ම මුදල් මාරු කිරීම සඳහා බැංකු ක්‍රම ආරම්භ විය. තවත් වැදගත් මුදල් ගනුදෙනු ක්‍රමයක් වූයේ විනිමය බිල්පත් ක්‍රමයයි.

මුල දී වෙළඳ ගනුදෙනු සඳහා විදේශවලට යාමේ දී විශාල කාසි පොදි රැගෙන යා යුතු විය. එහෙත් විනිමය බිල්පත් හා බැංකු ක්‍රමය නිසා ඕනෑම මුදල් ප්‍රමාණයක් ගනුදෙනු සඳහා භාවිත කළ හැකි විය.

විනිමය බිල්පත් සහ බැංකු පහසුකම් නිසා ඕනෑ ම විශාල මුදල් ප්‍රමාණයක් ගනුදෙනු කළ හැකි විය.

විනිමය බිල්පත් බැංකු ක්‍රම නිසා අනාරක්ෂිත තත්ත්වය මග හැරී යාම නිසා වෙළෙඳාම මෙන් ම දේශ ගවේෂණ ව්‍යාපාරවල ද වර්ධනය හේතු විය.

තනි ව ව්‍යාපාර කටයුතුවල යෙදීමේ අවදානම්බව නිසා මිලදට බද්ධ ව්‍යාපාර බිහිවීම දක්නට ලැබේ.

**නිදසුන් :** ✦ 1600 දී ආරම්භ වූ ඉංග්‍රීසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම

✦ 1602 ලන්දේසි පෙරදිග ඉන්දියා වෙළෙඳ සමාගම

කල්යාමේ දී එවැනි බද්ධ ව්‍යාපාර සමාගම් රාශියක් බිහි විය

**ක්‍රියාකාරකම**

**කුරුස යුද්ධ සමග වෙළෙඳාමේ වර්ධනය සිදු වූ ආකාරය පහදන්න.**

## පුනරුදය

පුනරුදය යනු යළි පිබිදීමයි. එනම් යුරෝපයේ සංස්කෘතික අංශයේ මෙන් ම දේශපාලන, සමාජයීය, ආගමික, ආර්ථික විද්‍යාත්මක ආදී සෑම අංශයක ම ඇති වූ ප්‍රබෝධය හා විකාශනය මෙම පුනරුදය නැතහොත් යළි පිබිදීමට අයත් වේ.

පුනරුදය ඇතිවීමට ආසන්න ම හේතුව වූයේ ක්‍රි.ව. 1453 දී ඔටෝමන් තුර්කිවරුන් විසින් නැගෙනහිර රෝම අධිරාජ්‍යයේ අගනුවර වූ කොන්ස්තන්තිනෝපල් නගරය අල්ලා ගැනීම යි. මධ්‍යතන යුගයේ දී පැරණි ග්‍රීක - රෝම සාහිත්‍යය හා දාර්ශනික කෘතීන් ආරක්ෂා වී පැවතියේ කොන්ස්තන්තිනෝපල් නගරයේ ය. කොන්ස්තන්තිනෝපලය තුර්කීන් සතුවීම නිසා ක්‍රිස්තු භක්තික උගත්තු එම පොත් සම්භාරයක් ද රැගෙන බටහිර යුරෝපයට පලා ගියහ. ඉන් අනතුරු ව යුරෝපය පුරා මෙම ග්‍රීක රෝම කෘති වැඩි වැඩියෙන් පරිශීලනය කිරීම නිසා ග්‍රික - රෝම සංස්කෘතීන්හි යළි ප්‍රබෝධය ඇති විය.



**රූපය 7.8 - මධ්‍යගත යුගයේ චිත්‍රයක්**

**මෙහි විශේෂ ලක්ෂණය වන්නේ ආගමික සිතිවිලි හා සුචරිතයට මුල් තැන දීම හා කළාකරුවන්ගේ සාමුහිකත්වය නිසා නිර්මාණ නිර්නාමික විය.**

මීට අමතර ව පුනරුදයට තුඩු දුන් දීර්ඝ කාලීන හේතු කිහිපයක් ද වෙයි. ඒ අතර ඉතා ම වැදගත් සාධකය නම් දෙළොස්වන සියවසේ පමණ සිට යුරෝපයේ වෙළෙඳාම සම්බන්ධයෙන් ඇති වූ වර්ධනය යි. වෙළෙඳාම නිසා ඉතාලි නගරවල ධනවත් පිරිසක් බිහි විය. මොවුනට ශාස්ත්‍රීය අංශ කෙරෙහි අවධානය යොමු කිරීමට විවේකය තිබූ අතර ඊට අනුග්‍රහය දක්වීමට අවශ්‍ය තරම් ධනයක් ද තිබිණි. නිදසුන් : මිලානයේ ස්ෆෝසා, ප්ලෝරන්ස්හි මෙඩිචී, පුරාහි එස ්ටේ සහ මාන්ටුවාහි ගොන්සාගා වැනි ධනවත් පවුල් ද මෙම කටයුතු සඳහා අනුග්‍රහය දක්වා ඇත. තව ද මානවවාදී පාප්වරයෙකු ලෙස සැලකෙන පස්වන නිකලස්, වතිකානුවේ පුස්තකාලය ගොඩනැගීමට අනුග්‍රහය දැක්වීම. ඊට අමතර ව හයවන ඇලෙක්සැන්ඩර්, දෙවන ජුලියස්, දහවන ලියෝ යන පාප්වරු ඉතාලිය කලාත්මක පුරවරයක් කිරීම සඳහා සුප්‍රසිද්ධ කලාකරුවන්ට අනුග්‍රහය දැක්වූහ.

ඉතාලියේ දෙළොස්වන සියවසේ පමණ සිට විශ්වවිද්‍යාල බිහි වී තිබුණි. එම විශ්වවිද්‍යාල මගින් ශාස්ත්‍රීය නවෝදයට අවශ්‍ය බුද්ධිමය පරිසරය ගොඩනැගීමට අවශ්‍ය නිදහස් චින්තනයට මග පාද ඇත.

## පුනරුදයේ විශේෂ ලක්ෂණ

මධ්‍යතන යුගයේ ආගමික මුහුණුවරක් ගත් කලාව හා සාහිත්‍යය, පුනරුද අවධියේ දී ලෞකික මුහුණුවරක් ගත්තේ ය. ආගමික ඉගැන්වීම් සම්පූර්ණයෙන් ම බැහැර නොකළ නමුත් මධ්‍යතන යුගයේ දී මෙන් බාධාකාරි මැදිහත්වීම්වලට ඉඩ නොලැබිණි. ලෞකික ස්වභාවය වඩාත් ම දක්නට ලැබුණේ කලා ක්ෂේත්‍රයේ ය. ලෞකික සැප සම්පත් අගය කළ ලෞකික රස වින්දනය බලාපොරොත්තු වූ ගිහි ධනවතුන් පුනරුද සමයේ කලාකරුවන්ට අනුග්‍රහ දැක්වීමට ඉදිරිපත් වූ අතර දක්ෂ කලාකරුවනට සිය පුද්ගලිකත්වය ඉස්මතුවන සේ නිර්මාණ ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබුණි.



**රූපය 7.9 - පුනරුද යුගය,**

**රසවින්දනය හා පුද්ගලිකත්වයට මුල්තැනදීම, ස්වභාවිකත්වයට මුල්තැන දීම, නග්න බව**


පුද්ගලයා, වැදගත් කොට සැලකීම මෙකල දක්නට ලැබුණ තවත් විශේෂ ලක්ෂණයකි. මේ නිසා තරගකාරී ව පුද්ගල දක්ෂතා ප්‍රදර්ශනය කර ස්වකීය අපේක්ෂා ඉටුකර ගැනීමට උත්සාහ ගැනිණි. මේ නිසා මධ්‍යකාලීන යුගයේ වූ සාමුහිකබව බිඳ වැටුණි.

## මානව වාදය මතුවීම


මානව වාදය යනු සියල්ලට ම වඩා මිනිසා වැදගත් ය යන සංකල්පයයි. වැඩවසම් යුගය අවසානයේ දී මානව වාදය පිළිබඳ සංකල්පය වඩාත් තහවුරු විය. මෙම යුගයේ මිනිසා බුද්ධියට තර්කනයට හා රසඥතාවට, මුල්තැන දෙමින් සාහිත්‍ය කලා, ඉතිහාසය, නීතිය, තාරකා විද්‍යාව වැනි විෂයයන් ඉගෙනීමට පෙළඹුණි.



**රූපය 7.10 - පුනරුද සමයේ දේව රූප පවා අඩනිරුවතින් ම ඇඳ තිබීම**



**රූපය 7.11 - මොනාලීසා**



**රූපය 7.12 - අන්තිම රාත්‍රී භෝජනය**

ග්‍රීක ලතින් භාෂාවලට නව පණක් ලැබීම, මධ්‍යතන යුගයේ යුරෝපා රටවල ගෝත්‍රික භාෂා භාවිත වූ අතර, ආගමික කටයුතු හා නීතිය හැදෑරීම වැනි අවස්ථාවල දී ලතින් භාෂාව භාවිත විය. මේ නිසා ග්‍රීක භාෂාව යටපත් විය. පුනරුද යුගයේ මේ භාෂා දෙකට ම නව පණක් ලැබුණ අතර මෙම භාෂාවලින් වූ පොත්පත් කියවීමට පටන් ගැණින. මේ නිසා විශේෂයෙන් ම ග්‍රීක නාට්‍ය, සාහිත්‍ය පිළිබඳ නව ප්‍රබෝධයක් ඇති විය. ඒ වාගේ ම ග්‍රීක හා ලතින් භාෂා ඉගෙනීම විලාසිතාවක් බවට පත්වීම නිසා ප්‍රාදේශීය භාෂා අකර්මණ්‍ය විය. ග්‍රීක හා ලතින් භාෂා හැදෑරීම නිසා යුරෝපා භාෂා සාහිත්‍යයේ නව ප්‍රබෝධයක් ඇතිවිය. මෙකල ඉතාලියේ විසූ වැදගත් ගත් කතුවරුන් වශයෙන් ඩාන්ටේ, පෙට්රාක්, බොකෑෂියෝ හැඳින්විය හැකි ය. එංගලන්තයේ තෝමස් මුවර්, ෆ්‍රැන්සිස් බේකන්, හා විලියම් ෂේක්ස්පියර් ද ඕලන්දයේ ඉරාස්මස් ද ඉතා වැදගත් තැනක් ඉසිලූහ.



**රූපය 7.13 - සිල්වත් බව දැක්වෙන පියෙටා රූව**

පුනරුද සමයේ කලා කෘති අතුරින් චිත්‍ර කලාවට සුවිශේෂ වූ ස්ථානයක් හිමි වේ. පුනරුදයේ අනෙක් සෑම අංශයක මෙන් ම චිත්‍ර පිළිබඳවත් වැදගත් මධ්‍යස්ථානය වූයේ ඉතාලියේ ප්ලොරන්ස් නගරයයි. මැසෙක්සියෝ, බොට්ටිචෙල්ලි, ලියනාඩෝ ඩාවින්චි, රෆායල් සහ මයිකල් ආන්ජිලෝ වැනි නිර්මාණකරුවන් මේ යුගයේ බිහි වූ අයගෙන් ප්‍රධාන වේ.



**රූපය 7.14 - රෝමයේ සිස්ටයින් දේවස්ථානයේ සිවිලිමේ මයිකල් ආන්ජිලෝ විසින් නිර්මාණය කර ඇති චිත්‍ර සමූහය**

මේ අතුරින් ලියනාඩෝ ඩාවින්චි චිත්‍ර ශිල්පියෙහි පමණක් නොව, සියලු කලාවන්ගේ ප්‍රවීණයෙක් විය. කවියෙකු, සංගීතඥයෙකු, ප්‍රායෝගික ඉන්ජිනේරුවරයෙකු පමණක් නොව විද්‍යාඥයකු ද විය. ඔහුගේ මොනාලිසා හා අන්තිම රාත්‍රී භෝජනය යන චිත්‍ර අද පවා විශ්ව කලා කෘති වශයෙන් ජනප්‍රිය ව පවතී.

රෝමයේ සිස්ටයින් දේවස්ථානයේ සිවිලිමේ මයිකල් ආන්ජිලෝ විසින් නිර්මාණය කර ඇති චිත්‍ර සමූහය ඉතා වැදගත් ය.

පුනරුද සමයේ කලා කෘති අතර නෙළීම ද වැදගත් වෙයි. අග්‍රගණ්‍යයේ ප්‍රතිමා ශිල්පියා වූ මයිකල් ආන්ජිලෝගේ ප්‍රතිමා අතර කිරිගරුඬින් නෙළා ඇති ඩේවිඩ්ගේ රුව (දවිත්ගේ රුව) සහ පියෙටා රුව ද ප්‍රධාන වෙයි.



රූපය 7.15 - ගොතික් ශෛලිය කේතුරූපාකාර ආරුක්කු ශීඝ්‍රයෙන් මුදුන්වන උස් වහළ මධ්‍යකාලීන යුගය

මධ්‍යතන යුගයේ ගෘහ නිර්මාණ ශිල්පය වශයෙන් භාවිත වූයේ ගොතික් ශෛලියයි

රෝම ගෘහ නිර්මාණ ශිල්පයට අනුව වෘත්තාකාර හැඩයෙන් යුත් ආරුක්කු හා වහළවලින් යුක්ත විශාල ගොඩනැගිලි ඉදිකිරීම පුනරුද සමයේ සිදු විය. මේ අතරින් දෙව් මැදුරු ප්‍රධාන වේ. මෙම ගොඩනැගිලි ක්‍රි.ව. 1506 දී දෙවන ජුලියස් පාප්තුමාගේ අනුග්‍රහය යටතේ රෆායල්, මයිකල් ආන්ජලෝ, ආදී දක්ෂ කලාකරුවන් අතින් නිර්මාණය වූ ප්‍රතිමා සහ චිත්‍ර ආදියෙන් අලංකාර වී ඇත.



රූපය 7.16 - රෝමයේ ශාන්ත පීතර දෙව්මැදුර

## විද්‍යාත්මක ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රබෝධය


- පෝලන්ත ජාතික නිකලස් කොපර්නිකස් විසින් පෘථිවිය ගෝලාකාර බවත්, අනිකුත් ග්‍රහයන් සූර්යයා වටා පරිභ්‍රමණය වන බවත් සොයා ගැනීම
- ජොහැන්නස් කෙප්ලර් විසින් සෞරග්‍රහ මණ්ඩලයේ ග්‍රහලෝක සූර්යයා වටා ඉලිප්සාකාර ව ගමන් ගන්නා බව සොයා ගැනීම
- ඉතාලි ජාතික ගැලිලියෝ ගැලිලි විසින් දුරදක්නය නිපදවීම



රූපය 7.17 - මයිකල් ආන්ජලෝ විසින් නිර්මාණය කරන ලද උද්‍යානය

එමගින් ආකාශ වස්තු පරීක්ෂා කර චන්ද්‍ර ආවාට, බ්‍රහස්පති ග්‍රහයාගේ උපග්‍රහයන් ආදී තොරතුරු සොයා බලන ලදී. මොහු "අත්හද බැලීමේ පියා" ලෙස සැලකේ.

- සර් අයිසෙක් නිව්ටන් විසින් ගුරුත්වාකර්ෂණ නියමය සොයා ගැනීම
- මේ අවධියේ වෛද්‍ය විද්‍යාවේ නවෝදයක් ඇති වී ය. ඉංග්‍රිසි ජාතික විලියම් හාවේ විසින් මිනිස් සිරුරේ රුධිර සංසරණ පද්ධතිය පිළිබඳ වැදගත් තොරතුරු හෙළිකර ගැනීම



රූපය 7.18 - ඉලිප්සාකාර ගමන් මග

- ස්විස් ජාතික වෛද්‍ය පැරසල්සස් විසින් ලෙඩ රෝග සෑදීමට තුඩු දෙන හේතු ද ඒවාට ප්‍රතිකර්ම ද අත්හදා බැලීම

ඔහු නූතන ඖෂධ විද්‍යාව කෙරෙහි ද රෝග චිකිත්සක ක්‍රම කෙරෙහි ද විශාල බලපෑමක් කළේ ය.

- වෛද්‍ය මයිකල් සර්වෙටස් රුධිරය හදවතේ දකුණු කෝෂයකින් පිට වී ගොස් පෙනහලු මගින් පිරිසිදු වී යළිත් හදවතට පැමිණ ශරීරය පුරා විසිරීයාම පිළිබඳ ව තොරතුරු සොයා ගැනීම



රූපය 7.19 ගැලිලි දුරදක්නය

- චීනයෙන් බටහිරට ගෙනගිය මුද්‍රණ ශිල්ප ක්‍රමය ඇසුරින් ක්‍රි.ව. 1447 දී ජර්මන් ජාතික ජොහැන්නස් ගුටන්බර්ග් විසින් මුද්‍රණ යන්ත්‍රය නිපදවීම

පුනරුද සමයේ ඇති වූ මෙම දියුණුව සහ ශාස්ත්‍රාලෝකය, ග්‍රීක රෝම ශිෂ්ටාචාරවල අංග ලක්ෂණ යළි පණගැන්වීමක් පමණක් නො වී ය. එය අටවන සියවසේ පමණ සිට වැඩෙමින් පැවැති ආසියානු හා අරාබි ශිෂ්ටාචාරවල වැදගත් අංග ලක්ෂණ රාශියක අභාසය ලබා ඇත. විශේෂයෙන් වීජ ගණිතය, රේඛා ගණිතය, මිනින්දෝරු විද්‍යාව, තාරකා ශාස්ත්‍රය, ආරෝග්‍ය ශාලා ක්‍රමය ආදී බොහෝ දෑ යුරෝපා ජාතීන් ලබාගත්තේ ආරාබීන් මගින් ආසියාවෙනි.


**ක්‍රියාකාරකම**

**පුනරුද සමයේ කලා, ගෘහ නිර්මාණ හා විද්‍යාවේ ඇති වූ දියුණුව පිළිබඳ පුවත්පතකට වාර්තාවක් සකස් කරන්න.**

# යුරෝපයේ ජාතික රාජ්‍ය

වැඩවසම් යුගයේ එක් එක් ප්‍රාදේශීය පාලකයන් යටතේ බලය විකේන්ද්‍රගත ව පැවතුණි. මේ හේතුව නිසා තමන් ජීවත්වන ප්‍රදේශයේ නගරයේ වැසියන් ලෙස සිතුවා විනා එකමුතු ජාතියක් ලෙස හැඟීමක් නො වී ය. වැඩවසම් ක්‍රමය පරිහානියට පත් වී නූතන යුගය උදවන විට එනම්, දෙළොස්වන සියවසේ පමණ සිට විවිධ ක්ෂේත්‍රවල ඇති වූ වෙනස්කම් වලට අනුරූප ව දේශපාලන ක්ෂේත්‍රයේ වූ පෙරළිය "ජාතික රාජ්‍ය" හෙවත් "නව රාජාණ්ඩු ක්‍රමය" බිහි වීමයි.

ඒ අනුව, පෙර තිබූ ප්‍රාදේශීය පාලන ඒකක සියල්ල යුද්ධ, විවාහ සම්බන්ධතා, උරුමය ආදී නොයෙකුත් උපක්‍රම අනුගමනය කරමින් එක් පාලකයෙකු යටතේ එක්සත් කිරීමේ ක්‍රියාවලියක් යුරෝපයේ මතු වෙමින් තිබුණි.



රූපය 7.20 - මුද්‍රණ යන්ත්‍රය

**නිශ්චිත දේශ සීමාවක් තුළ වාසය කළ එක ම භාෂාවක් කතා කළ, එක ම සංස්කෘතියකට අයත් ගෝත්‍ර කිහිපයක් ඇතැම් රජවරුන්ගේ පුරෝගාමීත්වයෙන් එක්සත් කිරීම තුළින් බිහිකර ගත් රාජ්‍ය "ජාතික රාජ්‍ය" නම් වේ.**

## ජාතික රාජ්‍යයේ ලක්ෂණ

- ✍ රජ වෙත සියලු බලතල කේන්ද්‍රගත වූ පාලන ක්‍රමය
- ✍ රජවරුන්ගේ උපදේශකයන් හා රාජ්‍ය සේවකයන් සම්බන්ධයෙන් ඇති වූ වර්ධනය
- ✍ රජවරුන් තම උපදේශකයන් හා සේවකයන් තෝරා ගත්තේ රාජ්‍ය කටයුතුවලට සම්බන්ධ වීමේ වරප්‍රසාද හිමි ව තිබූ වංශාධිපතියන්ගෙන් නොව අලුතින් වර්ධනය වෙමින් තිබූ මධ්‍යම පන්තිය අතරිනි. නව නිලධාරී පැලැන්තියක ආරම්භය හා වර්ධනය
- ✍ රාජ්‍ය සේවකයන්ට වැටුප් ගෙවීමේ ක්‍රමය නිසා වැඩවසම් ක්‍රමයේ සිටි උපදේශකයන්ට මෙන් ගැති නොවී කටයුතු කිරීමට රජුට හැකි වීම
- ✍ නව සමාජ පන්ති බිහි වීම
- ✍ රජුට ස්ථිර යුද හමුදවක් සිටීම
- ✍ ක්‍රිස්තු සභාවේ ආධිපත්‍යය බිඳ වැටීම

  යුරෝපීය ක්‍රිස්තු සභාව විසිරී ගොස් රෙපරමාදු ආගම් බිහිවීම නිසා ඇතැම් නව රාජාණ්ඩු රෙපරමාදු ආගම් පිළිගැනීම
- ✍ ජාතික රාජ්‍යවල පරිපාලන හා වෙළෙඳ කටයුතු පහසුවෙන් කරගැනීම සඳහා සමස්ත රාජ්‍යයට ම පොදු වූ ඒකීය නීති පද්ධති හා ඒකීය  බදු ප්‍රතිපත්ති සකස් කිරීම
- ✍ වාණිජවාදය නම් ආර්ථික දර්ශනය අනුගමනය කිරීම "ඝනරන්වාදය" හිතකර වෙළඳ ශේෂය, රජය ආර්ථික කටයුතුවලට මැදිහත්වීම සහ පාලනය කිරීම හා ස්වයංපෝෂිත වීම වාණිජවාදයේ ලක්ෂණයයි. ඝනරන්වාදය යනු කිසියම් රටක් තුළ  එක්රැස් වී ඇති වස්තුව හෙවත් ඝන රන් රිදී සංචිතය මිනුම් දණ්ඩ වශයෙන් ගෙන එහි වත්කම තක්සේරු කිරීම, ඒ අනුව හැම රටක් ම උත්සාහ කළේ හැකි තරම් මුදල්  සහ ඝන රන් රිදී තම රට තුළ වර්ධනය කර ගැනීමට යි
- ✍ ස්වයංපෝෂිතබව ඇතිකර ගැනීම

  රටේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීම සඳහා යුරෝපයෙන් පිටත වෙළඳපොළ සෙවීමට යටත් විජිත ගොඩනගා ගැනීම
- ✍ විසිරී තිබූ ප්‍රදේශ සහ බලතල එක්සත් කර බලවත් රාජාණ්ඩු ගොඩනගා ගැනීම

  ඒ අනුව මුල දී යුරෝපයේ එංගලන්තය, ස්පාඤ්ඤය, ප්‍රංශය ආදී රටවල ඉහත ලක්ෂණ සහිත රාජාණ්ඩු බිහි විය

**ක්‍රියාකාරකම**

**ජාතික රාජ්‍ය යනු කුමක්දැයි පහදා දෙමින් එහි ලක්ෂණ පහදන්න.**


## දේශ ගවේෂණය

ක්‍රි.ව. 1453 දී පෙර අපර දෙදිග ප්‍රධාන වෙළෙඳ මධ්‍යස්ථානය වූ කොන්ස්තන්තිනෝපලය තුර්කීන් සතුවීම නිසා ඔවුන් වෙළෙඳ ද්‍රව්‍යවල මිල වැඩිකිරීම තීරුබදු වැඩිකිරීම, අත්‍යවශ්‍ය භාණ්ඩ කලට වේලාවට ලබා නොදීම ආදී අවහිරතා ඇතිකරන ලදී. වෙළෙඳාමෙන් ආර්ථිකය ශක්තිමත් කරගෙන සිටි මුස්ලිම්වරුන්ට යුරෝපයේ ක්‍රිස්තු සංවිධානය පරාජය කිරීමට ද හැකියාව ලැබුණි.  මේ බව අවබෝධ කරගත් යුරෝපීයෝ තමන් ම ආසියාතික ප්‍රදේශවල වෙළෙඳමේ යෙදීමටත්, එමගින් මුස්ලිම්වරුන් ආර්ථිකය කඩා බිඳ  දැමීමටත් අරමුණු කර ගනිමින් ආසියාවට පිවිසීමේ අලුත් මුහුදු මාර්ග සෙවීමට යොමු වූහ.

එමෙන් ම මේ වන විට ප්‍රෙස්ටර් ජෝන් නමින් හැඳින්වූ රජෙකුගේ විශාල ක්‍රිස්තු රාජ්‍යයක් පෙරදිග තිබෙන බවට ජනප්‍රවාදයක් ක්‍රිස්තු භක්තිකයන් අතර විය. එකී ක්‍රිස්තු රාජ්‍ය සොයා ගැනීම ද ක්‍රිස්තු ධර්මය පතුරුවා එවකට සිදුවෙමින් පැවති ඉස්ලාම් ධර්ම ව්‍යාප්තිය වැළැක්වීම ද යුරෝපියන් පෙරදිගට පැමිණීමට හේතු වූ කාරණා විය.

දේශ ගවේෂණය සඳහා සුදුසු පරිසරයක් යුරෝපයේ ඇති වීමට බලපෑ සාධක :

- ටොලමිගේ ලෝක සිතියම මගින් ලෝකය පිළිබඳ නිසි අවබෝධයක් ලැබීම
- පුනරුදයේ දී ලෝකය ගෝලාකාරබව සොයා ගැනීම, නාවික ගමන්වල සුරක්ෂිත ව යෙදීමට හැකි වූ මාලිමා යන්ත්‍රය, උතුරු තරු මාපකය නිපදවීම




**සිතියම 7.2 - දේශ ගවේෂණ සිතියම**


පෞද්ගලික ව්‍යවසායකයින් අවදානම් සහිත අවිනිශ්චිත ව්‍යාපාරවල යෙදීම නොකරන විට මේ කාලයේ අලුතින් බිහි වූ ජාතික රාජ්‍ය ඊට අනුග්‍රහය දැක්වී ය.



**රූපය 7.21 - නාවික හෙන්රි**



**රූපය 7.22 - වස්කෝද ගාමා**



**රූපය 7.23 - ක්‍රිස්ටෝපර් කොළොම්බස්**

පෘතුගාලය ක්‍රි.ව. 1453ටත් පෙර සිට ම දේශගවේෂණය සඳහා යොමු වී තිබුණි. අතරමැදි වෙළෙඳුන්ගෙන් වෙළඳ ද්‍රව්‍ය මිල දී ගැනීමේ දී ඒවා අධික මිලකින් යුක්ත විය. මේ නිසා එම ද්‍රව්‍ය සෘජු ලෙස ම ආසියාවෙන් ලබාගැනීම සඳහා ආසියාවට ඇතුළු වීමට නව මුහුදු මාර්ගයක් සොයා ගැනීමට අවශ්‍ය විය.

පෘතුගාලයේ හෙන්රි කුමාරයා ක්‍රි.ව. (1394 - ක්‍රි.ව. 1460) ආර්ථික හා විද්‍යාත්මක සත්‍ය දැනගැනීමේ කුතුහලය, ආගමික අභිලාෂය, ජාතික හැඟීම යන කරුණු අනුව වසර 40ක් පමණ තිස්සේ නාවික කටයුතු වැඩි දියුණුවට කටයුතු කර ඇත. මේ නිසා ඔහු නාවික හෙන්රි යන නමින් හඳුන්වනු ලැබේ. ඔහු විශාල මුදලක් වියදම් කර ආකාශ වස්තු පර්යේෂණ ආයතනයක් පවත්වාගෙන ගොස් ඇත. පෘතුගීසින් අප්‍රිකාවේ බටහිර වෙරළ ඔස්සේ දකුණු ප්‍රදේශ දක්වා පැමිණියේ ය.

ස්පාඤ්ඤය ද නාවික කටයුතු සඳහා ඉසබෙලා හා පර්ඩිනන්ඩ් යුවළගේ අනුග්‍රහය මත යොමු විය. ඒ අනුව ක්‍රිස්ටෝපර් කොළොම්බස් විසින් බටහිර ඉන්දීය දූපත් හා ඇමරිගෝ වෙස්පුෂි විසින් ඇමරිකා එක්සත් ජනපදය සොයාගැනීම ද මෙහි දී වැදගත් වේ.

බර්තොල්මියුඩයස්ගේ නායකත්වය යටතේ අප්‍රිකාවේ දකුණු තුඩුවට පැමිණි නෞකාවක් කුණාටුවකට අසුවීම නිසා එය "කුණාටු තුඩුව" ලෙස නම් කර ඔවුහු පෙරළා තම රට වෙත ආහ. පෘතුගාලය මෙම තුඩුව සුභ ප්‍රාර්ථනා තුඩුව ලෙස නම් කර තිබේ. ක්‍රි.ව. 1498 දී වස්කෝ ද ගාමා ඉන්දියාවේ කැලිකට් වරායට ගොඩ බැස ඇත. එය යුරෝපීයන් ප්‍රථම වරට ආසියාවට පැමිණීමට සොයාගත් නව මුහුදු මාර්ගය යි.

**දේශ ගවේෂකයින් සහ ඔවුන්ගේ නව සොයා ගැනීම්**

| | | | |
|---|---|---|---|
| බර්තෝල්මියු ඩයස් | - කුණාටු තුඩුව | කැබේ පිය පුතු | - කැනඩාව |
| ක්‍රිස්ටෝපර් කොලම්බස් | - හිස්පැණියෝලාව | වස්කෝද ගාමා | - ඉන්දියාව |
| ඇමරිගෝ වෙස්පුෂි | - ඇමරිකාව | පර්ඩිනන්ඩ් මැගලන් | - පිලිපීනය |

ඒ අනුව පෘතුගාලය, ස්පාඤ්ඤය, ඕලන්දය, ඉතාලිය, ප්‍රංශය, එංගලන්තය, දේශ ගවේෂණ ව්‍යාපාරවල යෙදුන රටවල් වේ.

## දේශ ගවේෂණයේ ප්‍රතිඵල

- ආසියාව, අප්‍රිකාව, හා ලතින් ඇමරිකානු රටවල යුරෝපීය බලය ව්‍යාප්ත වීම
- රටවල් ඈඳා ගැනීම සහ යටත් විජිත බිහිවීම
- ආගමික ප්‍රචාරක කටයුතු ව්‍යාප්ත වීම
- වෙළෙඳාම දියුණුවීම
- කාර්මික විප්ලවය කරා යොමු වීම
- යුරෝපා ශිෂ්ටාචාරය ව්‍යාප්ත වීම

**ක්‍රියාකාරකම්**

**දේශගවේෂකයින් සහ ඔවුන් හඳුනාගත් රටවල් හා ස්ථාන පිළිබඳ ව වාර්තාවක් සකස් කරන්න.**

## ආගමික ප්‍රතිසංස්කරණ

මධ්‍යතන යුගයේ ආගම මනුෂ්‍ය ජීවිතයේ සෑම අංගයක් කෙරෙහි ම පැතිරී තිබුණි. විවාහ ලියාපදිංචිය, උපත් මරණ ලියාපදිංචිය, ආදිය මගින් සමාජයේ සංවිධානාත්මක වෙනසක් ඇති කිරීම හා සදාචාරාත්මක බවක් ඇති කිරීම ද ආගම විසින් සිදු කෙරුණි. අධ්‍යාපනය ලබා දීම ද කතෝලික සභාව සතු කාර්යයක් විය. කෙසේ වුව ද එතෙක් පැවති ක්‍රමය පුනරුදය නිසා ඇති වූ චින්තන විප්ලවය, විද්‍යාත්මක දියුණුව හා නව සොයාගැනීම්, හේතුකොට ගෙන වෙනස්වීම්වලට භාජනය විය. තමන් අවට පරිසරය දෙස වඩාත් විචාරාත්මක ව බැලීමට ජනයා පුරුදු විය. මේ අනුව මධ්‍යතන යුගයේ ආගමික ඉගැන්වීම් හා එහි සංවිධානය දෙස විචාරාත්මක ලෙස බලන පිරිසක් බිහි විය.



රූපය 7.24
**බයිබලය ඉංග්‍රීසි බසින් කියාදීම**

මෙම ආගමික ප්‍රතිසංස්කරණයේ දී රෙපරමාදු ව්‍යාපාරයට ආගමික, දේශපාලනික හා ආර්ථික වැනි විවිධ කරුණු රැසක් බලපා ඇත.

මධ්‍යතන යුගයේ අවසාන කාලය වන විට කිතුනු සභාව යම් ප්‍රමාණයකින් ලෞකිකත්වයට හැරී පැවතුණි. අධිරාජ්‍යයා සහ රජවරුන් තමන්ගේ දේශපාලන බලතල හා දේපල ආරක්ෂා කර ගැනීම පිණිස ආගමික නායකත්වය ද ලබාගැනීම මෙයට හේතු විය. මෙලෙස පාලක පන්තියෙන් පත් වූ බොහෝ ආගමික නායකයන් වඩාත් අවධානය යොමු කළේ අධ්‍යාත්මික වර්ධනයට වඩා තමන්ගේ ලෞකික සැප සම්පත් රැක ගැනීමට ය.

මීට අමතර ව නැගී එමින් තිබූ ජාතික රාජ්‍යවල රජවරු තම දේශපාලන බලයට වඩා පූජකවරුන්ගේ බලය ඉහළ ගොස් තිබූ නිසා කිතුනු සභාවේ බලය සීමා කිරීමට අවස්ථාව ලැබෙන තෙක් බලා සිටියහ. කිතුනු සභාව සතු ව තිබූ දේපල ආපසු ලබාගැනීමට රජවරුන් හා නැගී එමින් සිටි මධ්‍යම පන්තිකයින් තුළ තිබූ අපේක්ෂාව ද ප්‍රතිසංස්කරණවලට හේතු විය.

මෙම තත්ත්වය හමුවේ පළමුවෙන් කිතුනු සභාව විවේචනයට භාජනය කළේ විටෙන්බර්ග් සරසවියේ මහාචාර්යවරයකු වූ මාටින් ලූතර් ය. මාටින් ලූතර් යනු ඔගස්තීනු තාපස නිකායට අයත් පූජකතුමෙකි. සැබැවින් ම එතුමන්ට අවශ්‍ය වූයේ සභාවෙන් වෙන් වී නව නිකායක් ස්ථාපිත කිරීම නොව සභාවේ එවකට පැවති අඩුපාඩු පෙන්වා දීම ය. එතුමන් වඩාත් ම විරුද්ධ වූයේ පව් සමාව ලබනු වස් පූර්ණ ඵල විකිණීම කෙරෙහි ය. මාටින් ලූතර් පියතුමා සභාව තුළ දිස් වූ අඩුපාඩු වගන්ති අනූ පහක් (95) වන සේ ගොනු කොට 1517 නොවැම්බර් පළමුවන දින විටෙන්බර්ග් දේවස්ථානයේ දොරටුවේ ඇලවූයේ ය. මෙම වගන්ති කිතුනු සභාවේ ප්‍රතිසංස්කරණය බලාපොරොත්තු වූ සමහරුන්ගේ ප්‍රසාදයට හේතු විය. කෙසේ වුව ද මෙම වගන්ති අතර වැරදි සහගත ඒවා අස්කර ගැනීමට මාටින් ලූතර්ට පාප් වහන්සේගෙන් නියෝගයක් ලැබුණ නමුත් එතුමා එයට සූදනම් නො වී ය. මෙහි ප්‍රතිඵලයක් ලෙස මාටින් ලූතර් පියතුමා ව කතෝලික සභාවෙන් නෙරපා දැමීම සිදුවිය. එතැන් පටන් නව කිතුනු සභා බිහිවීමට පටන් ගත් අතර පාප්වහන්සේ මූලික කොට ගත් පැරණි කිතුනු සභාව "කතෝලික සභාව" නමින් හැඳින්විණි.

මාටින් ලූතර්ගෙන් පසු ව නව සභා බිහි කිරීමට මුල් වූයේ ප්‍රංශ ජාතික කැල්වින් සහ ස්වින්ග්ලි යන අය ය. ඔවුන් දෙදෙනා ද කිතුනු පූජකවරුන් ය. මෙම දෙදෙනාගේ ප්‍රතිසංස්කරණ ව්‍යාපාරයේ මූලස්ථානය වූයේ ස්විට්සර්ලන්තයයි. කිතුනු සභාවේ අඩුපාඩු පෙන්වා දෙමින් ලියූ තවත් අය අතර ජෝන් වයික්ලිෆ්, චෙක් ජාතික ජෝන් හස් සහ ඕලන්දයේ ඉරාස්මස් ද ප්‍රධාන තැනක් උසුලයි. ජෝන් වයික්ලිෆ් පළමුවරට බයිබලය ඉංග්‍රීසි බසට ද මාටින් ලූතර් විසින් ජර්මන් බසට ද පරිවර්තනය කිරීම සිදුවිණ. මෙම ප්‍රතිසංස්කරණවාදීහු ශුද්ධෝත්තම පාප්වහන්සේගේ බලය ප්‍රතික්ෂේප කළ අතර තම ඉගැන්වීම් හා දේව වන්දනාව බොහෝ දුරට ශුද්ධ වූ බයිබලය මත ම ගොඩනැංවූහ.

16 වන සියවස ආරම්භය වන විට ම ශුද්ධ රෝම අධිරාජ්‍යය පාප්වහන්සේගේ පාලනයෙන් මිදී ස්වාධීන රාජ්‍යයක් ගොඩනැගීමේ ප්‍රවණතාවක් මතුවෙමින් තිබුණි. මාටින් ලූතර්තුමා ගත් ප්‍රයත්නයට විශේෂයෙන් ජර්මනියේ ප්‍රාදේශීය කුමාරවරුන්ගේ අනුග්‍රහය ලැබුණි. මාටින් ලූතර්, ජෝන් කැල්වින්, උල්රිච්, ස්විංග්ලි යන අයගේ ප්‍රතිසංස්කරණ හැඳින්වූයේ රෙපරමාදු හෝ ප්‍රොතෙස්තන්ත්‍ර ව්‍යාපාරය වශයෙනි. මෙම ප්‍රොතෙස්තන්ත්‍ර ව්‍යාපාරය සාර්ථක වීමට ප්‍රධානතම හේතුව වූයේ ජර්මනියේ ප්‍රාදේශීය කුමාරවරුන්ගේ සහ එංගලන්තය, ප්‍රංශය වැනි රටවල රජවරුන්ගේ අනුග්‍රහය ලැබීමයි.

## ආගමික ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල

- ✍ යුරෝපයේ ආගමික ඒකාග්‍රතාව බිඳී ගොස් නව ආගමික සංකල්පය බිහි වීම
- ✍ ක්‍රිස්තු සභාව බෙදී යාම
- ✍ ශුද්ධ රෝමයේ අධිරාජ්‍යයේ බලපෑම දුර්වල වීම
- ✍ ප්‍රාදේශීය කුමාරවරුන්ගේ බලය වර්ධනය
- ✍ මිෂනාරි ව්‍යාපාරය

**ක්‍රියාකාරකම්**

**ආගමික ප්‍රතිසංස්කරණ සිදු වූ ආකාරය පිළිබඳ ව වාර්තාවක් සකස් කරන්න.**

## අභ්‍යාස

**01. පිළිතුරු සපයන්න**

01. යුරෝපයේ මධ්‍යතන යුගයට අයත් යැයි පිළිගන්නා කාලය කුමක් ද?
02. වැඩවසම් ක්‍රමයේ ලක්ෂණ තුනක් සඳහන් කරන්න.
03. කුරුස යුද්ධ යනු කුමක් ද?
04. කොන්ස්තන්තිනෝපලය තුර්කීන් සතු වූයේ කවදා ද?
05. බද්ධ ව්‍යාපාර ආරම්භ වූයේ ඇයි?
06. පුනරුදය යනු කුමක් ද?
07. පුනරුදයේ ලක්ෂණ තුනක් නම් කරන්න.
08. පුනරුද සමයේ සිටි කලා ශිල්පීන් තිදෙනෙකු නම් කරන්න.
09. ජාතික රාජ්‍යයක් යනු කුමක් ද?
10. ජාතික රාජ්‍යයක ලක්ෂණ 3ක් ලියන්න.
11. දේශගවේෂකයින් තිදෙනෙකු නම් කරන්න.
12. ආගමික ප්‍රතිසංස්කරණවලට හේතු තුනක් ලියන්න.
13. ආගමික ප්‍රතිසංස්කරණවලින් පසු බිහි වූ නව කිතුනු සභා මොනවා ද?

**2. හිස්තැන් පුරවන්න.**

01. වැඩවසම් ක්‍රමයේ දී රජුට වඩා ..................... බලවත් විය.
02. වැඩවසම් ක්‍රමයේ දී ............................ ආර්ථික රටාවක් විය.
03. ක්‍රිස්තු භක්තිකයන්ගේ ශුද්ධ භූමිය ............................ නම් වේ.
04. මධ්‍යතන යුගය ......................... වාදය පදනම් කරගෙනත් පුනරුද යුගය ..................... වාදය පදනම් කරගෙනත් සැකසී තිබුණි.
05. දුරදක්නය ............................ විසින් නිර්මාණය කරන ලදී.
06. විලියම් හාවේ මිනිසාගේ ................................ පිළිබඳ තොරතුරු අනාවරණය කර දුනි.
07. ජාතික රාජ්‍යවල බලතල ................................ පැවැතුණි.
08. කොන්ස්තන්තිනෝපලය .............................. වෙළඳ මාර්ග වැටී තිබීම නිසා වැදගත් නගරයක් විය.
09. බර්තොලමියු ඩයස් විසින් .................................. සොයාගන්නා ලදී.
10. කතෝලික සභාවට එරෙහි ව ගොඩනැගුණ ව්‍යාපාරය .......................... නම් වේ.

## සාරාංශය

✍ යුරෝපයේ මධ්‍යකාලීන යුගය වැඩවසම් ක්‍රමය අනුව හැඩගැසී තිබුණි. මේ කාලයේ වංශාධිපතිවරුන් බලවත් වූ අතර රජුගේ බලය හීන විය. ප්‍රවේණි දසයෝ ද වූහ.

✍ මධ්‍යතන යුගයේ දී සමාජය කෙරෙහි සභාවේ විශාල බලපෑමක් දක්නට ලැබුණි.

✍ ස්වයං පෝෂිත ආර්ථික රටාවක් මෙකල තිබුණු අතර බලය විකේන්ද්‍රගත වී තිබුණි.

✍ කුරුස යුද්ධ වැඩවසම් ක්‍රමයේ බිඳ වැටීමට හේතු විය.

✍ තුර්කීන් විසින් කොන්ස්තන්තිනෝපලය අල්ලා ගැනීම නිසා ඇති වූ ප්‍රතිඵල මත යුරෝපයට නව යුගයක් උදාවිය.

✍ ඒ අනුව යුරෝපයේ ශාස්ත්‍රීය ප්‍රබෝධය, ආගමික ප්‍රතිසංස්කරණ, විද්‍යාවේ දියුණුව, දේශ ගවේෂණය, වෙළෙඳාමේ දියුණුව යුරෝපයේ ආලෝකයක් වූ කරුණු රැසක් සිදුවීම.

## වැඩිදුර කියවීමට පොත්

☞ ලෝක ඉතිහාසය - මාලනී ඇඳගම, - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.
☞ යුරෝපා ඉතිහාසය - අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව.